ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

නීතිවේදී උපාධි පාඨමාලාව - 5 වන මට්ටම

දෙවන අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය - 2006

පරිපාලන නීතිය – LWU 3311/ 4311

කාලය - විනාඩි 40 යි

---

දිනය: 2006 නොවැම්බර් මස 9 වන දින    වේලාව පෙ.ව 10.15 – 10. 55 දක්වා

---

එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න

අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.

1. 'විශේෂයෙන් පෙන්වා දී ඇති පුද්ගලයන්ගේ යහපත උදෙසා පාවිච්චි කිරීම පිණිස බලයක් පොදු බලධාරියකු වෙත දී ඇති අවස්ථාවක දී හා ඔවුන් සම්බන්ධයෙන් එම බලය පාවිච්චි කරන ලෙස ඉල්ලා සිටීමට ඔවුනට අයිතියක් ලබා දෙන කොන්දේසි පිළිබඳව ව්‍යවස්ථාදායකය විසින් අර්ථ නිරූපණයක් ලබා දී ඇති අවස්ථාවක දී එම බලය පාවිච්චි කළ යුතු අතර එසේ එම බලය පාවිච්චි කරන ලෙස අධිකරණ විසින් අවශ්‍ය කෙරෙනු ඇත'. - Judicial Review of Administrative Action - S.A.de Smith 2nd edition p.270

   අභිමතානුසාරී බලය පිළිබඳ අධිකරණ පාලනය ඇසුරෙන් මෙම ප්‍රකාශය විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

2. අතුරු පාරවල් හා මාවත් පවරාගෙන ඒවා පුළුල් කිරීමට හා තම බල ප්‍රදේශයේ පොදු උපයෝගිතාවන් පවත්වාගෙන යාම සඳහා ප්‍රෝලන්තයේ පාර්ලිමේන්තු පණතක් මගින් එහි පළාත් පාලක අධිකාරියකට බලය දී ඇත. 2005 දී පළාත් පාලන අධිකාරිය විසින් නිවාස 7 ක් සඳහා ගමන් කළ හැකි අතුරු පාරක් පවරා ගත්තේය. මෙම නිවාසවල පදිංචිකරුවෝ පළාත් පාලන අධිකාරියට බදු ගෙවන්නෝ වූහ. මෑතක දී පවරා ගනු ලැබූ අතුරු පාර පළල් කරන ලෙස පෙරේරා මහතා හා අනෙකුත් පදිංචිකරුවෝ ලිඛිත ඉල්ලීමක් මගින් පළාත් පාලන අධිකාරියේ සභාපතිවරයාගෙන් ඉල්ලා සිටියහ. එහෙත් පළාත් පාලන අධිකාරිය මේ සම්බන්ධයෙන් කිසිදු පියවරක් නොගත්තේය.

   පෙරේරා මහතාට ලබා ගත හැකි නෛතික සහන කිසිවක් වේ නම් එය ලබා ගැනීම සඳහා ඔහු විසින් සපුරාලිය යුතු අවශ්‍යතා පැහැදිලි කරමින් ඔහුට ලබා ගත හැකි නෛතික සහනය සාකච්ඡා කරන්න

හිමිකම් ඇවිරිණි

************